**<u>වෛද්‍ය හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 හා එහි සංශෝධන යටතේ සහනදායී පදනම මත මෝටර් රථ ආනයන බලපත්‍ර ලබා ගැනීම සඳහා සපුරාලිය යුතු පිරික්සුම ලේඛනය</u>**

1. වෛද්‍ය හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 හා එහි සංශෝධන අනුව සියළු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් පමණක් ඉදිරිපත් කළ යුතු එම චක්‍රලේඛයේ ඇමුණුම III හි සඳහන් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම් පත
2. ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ පිටපතක්
3. මුල් පත්වීමේ ලිපියේ සහතික කළ පිටපතක් හෝ අදාළ පත්වීම් ලිපිවල සහතික කළ පිටපත් හා එම තනතුරුවල වැඩ භාරගත් ලිපිවල සහතික කළ පිටපත්
4. සේවය ස්ථිර කරන ලද ලිපියේ සහතික කළ පිටපතක්
5. සියලු උසස්වීම ලිපිවල සහතික කළ පිටපත්
6. අදාළ තනතුර/තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලද ලිපිවල සහතික කරන ලද පිටපත්
7. පත්වීම් දිනයේ සිට දරන ලද තනතුරුවලට අදාල ඒ ඒ වැටුප් කේත අංක සඳහන් ලිපිවල සහතික කරන ලද පිටපත්
8. සේවා කාලයට අදාළව නිවාඩු විස්තරයක්
9. ආයතන සංග්‍රහයේ විධිවිධානයන් අනුව හෝ ඒ ඒ ආයතනයන්හි භාවිතයට ගනු ලබන පාලන විධිවිධාන හෝ නීතිරීති අනුව මූලික විමර්ශනයක් හෝ විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ නොකළ නිලධාරියෙක් බවට ආයතන ප්‍රධානියාගෙන් සහතිකයක්
10. මීට පෙර බදු සහන යටතේ මෝටර් රථයක් ලබා ගෙන ඇත්නම්, එම මෝටර් රථය සඳහා විවෘත කරන ලද ණයවර ලිපියේ සහතික කරන ලද පිටපතක්/ දේශීයව එකලස් කරන ලද මෝටර් රථයක් නම් එය මිලදී ගැනීම සඳහා ගෙවීම් කළ රිසිට්පතෙහි සහතික කරන ලද පිටපතක්
11. අස්ථානගත වූ බලපත්‍රයක් වෙනුවට නව බලපත්‍රයක් අයදුම් කිරීමේදී, පොලිස් පැමිණිල්ලේ පිටපත හා බලපත්‍රය අහෝසි කිරීමේ ලිපියේ පිටපත
12. i. සහනදායී මෝටර් රථ බලපත්‍ර යෝජනා ක්‍රමයක් යටතේ මීට පෙර මෝටර් රථයක් ලබා ගෙන නොමැති නම් වෛද්‍ය හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 හි “1.1” සිට “1.9” දක්වා වන කාණ්ඩයන් යටතේ සුදුසුකම් ලබන තනතුරෙහි /තනතුරුවල අදාළ සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර ඇති බවට අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු දිවුරුම් ප්‍රකාශය හෝ

    ii. සහනදායී මෝටර් රථ බලපත්‍ර යෝජනා ක්‍රමයක් යටතේ මීට පෙර මෝටර් රථයක් ලබා ගෙන ඇත්නම් එය ආනයනය කිරීම සඳහා ණයවර ලිපිය විවෘත කළ දින සිට හෝ දේශීයව එකලස්

කරන ලද මෝටර් රථයක් සඳහා පළමු ගෙවීම සිදු කල දින සිට වසර 05 ක සක්‍රිය සේවා කාලයක් ඉක්මවා ඇති බවට අදාළ අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු දිවුරුම් ප්‍රකාශය

13. අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති ලේඛන හා තොරතුරු නිවැරදි බවට සහතික කරමින් ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු මේ සමඟ අමුණා ඇති පිරික්සුම් ලේඛනය (ඇමුණුම 01)

සැලකිය යුතුයි -

❖ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 හි “1.1” සිට “1.9” දක්වා වන කාණ්ඩයන් යටතේ සුදුසුකම් ලබන තනතුරු කිහිපයක සේවය කර ඇත්නම් එවැනි ඉල්ලීම් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බැවින්, ඉහත 2 සිට 9 දක්වා වූ සියළු ලිපිලේඛන එම එක් එක් ආයතනය සඳහා වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතුය.